iruonline.com

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2025 (2026)

## සිංහල භාෂාව හා සාහිත්‍යය

### I පත්‍රය - පිළිතුරු

| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 3 | 21. | 1 | 31. | 2 |
| 02. | 2 | 12. | 2 | 22. | 4 | 32. | 1 |
| 03. | 1 | 13. | 1 | 23. | 4 | 33. | 3 |
| 04. | 3 | 14. | 4 | 24. | 2 | 34. | 4 |
| 05. | 4 | 15. | 3 | 25. | 4 | 35. | 1 |
| 06. | 1 | 16. | 2 | 26. | 3 | 36. | 3 |
| 07. | 2 | 17. | 1 | 27. | 1 | 37. | 2 |
| 08. | 3 | 18. | 3 | 28. | 4 | 38. | 4 |
| 09. | 4 | 19. | 4 | 29. | 2 | 39. | 1 |
| 10. | 1 | 20. | 2 | 30. | 3 | 40. | 2 |

සිංහල භාෂාව හා සාහිත්‍යය
II පත්‍රය - පිළිතුරු

01.

(i) (අ) බ, ජ, ඨ, ඵ, එ
(ආ) ස, ඣ, ඪ, ඞ, හ

(ii) (අ) ලේකම් (ආ) ලේඛන

(iii) (අ) දෙටු (ආ) උත්තම

(iv) (අ) වනචාරි (ආ) සපතේරුවා

(v) (අ) කිරිමැටියාන - ආගම සන්ධිය
(ආ) වල්ලූරා - ද්විත්ව රූප සන්ධිය

(vi) (අ) පියවරු මවුවරුන් හා විදේශගත වූහ.
(ආ) සියලු මිනිසුන් සත්‍යගරුක විය යුතු ය.

(vii) (අ) ඔහු (ආ) ස්ත්‍රීන්

(viii) (අ) මිතුරන් විසින් මම ඉගෙනුම් කටයුතුවලට යොමු කරන ලදිමි/ ලද්දෙමි/ ලැබුවෙමි/ ලැබීමි.
(ආ) ගුරුවරියක විසින් මවක මෙන් සිසුවිය රැක බලා ගන්නා ලද්දී ය/ ගනු ලැබුවා ය.

(ix) (අ) පූර්ව ක්‍රියා
(ආ) මිශ්‍ර ක්‍රියා

(x) (අ) ආලපන විභක්තිය
(ආ) සම්බන්ධ විභක්තිය

(ලකුණු 02 ×10 =20)

02. ● ආදර්ශ මාතෘකා හා අන්තර්ගතය සකස් විය යුතු අන්දමට සංක්ෂිප්ත මග පෙන්වීමක්

(අ) මත් උවදුරින් දුරුවෙමු.

- මත් උවදුර හඳුනාගැනීම
- මත් උවදුරට ගොදුරු වීමේ හේතු
- මත් උවදුරින් දුරුවීමට විසඳුම්
- ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග

(ආ) මහමග අනතුරු - වළකමු නිරතුරු

- මහ මග අනතුරු යනු?
- මහාමාර්ග අනතුරුවලට හේතු
- මහාමාර්ග අනතුරුවලට විසඳුම්
- ඒ සඳහා ගත හැකි ක්‍රියාමාර්ග

(ඉ) වගාව හා අස්වැන්න ආශ්‍රිත ගොවි ගැටලු.

- වගා කටයුතු හා ඒ සඳහා ගන්නා වෙහෙස
- අස්වනු අලෙවි කර ගත නොහැකි වීම
- ගොවි හා පාරිභෝගික ජනයා මුහුණ දෙන ගැටලු
- ඒ සඳහා යෝජිත විසඳුම් හා ක්‍රියාමාර්ග

(ඊ) කියවීමට බාධා පමුණුවන ජංගම දූරකථනය

- ජංගම දූරකථනය අවභාවිතය
- කියවීමට එය බාධක වන අයුරු
- කියවීම ප්‍රවර්ධනය කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග

**ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25යි.**

1. සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළු ව - ලකුණු 08 යි.
2. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12 යි.
3. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි.

01. සාරවත් භාවය - ලකුණු 07 යි.
විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම - ලකුණු 01 යි.

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යුහයට සමීප බව, සරුබව හා සමබව, වචන ගණන 250 සමීප ව පැවතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු ය.

**සාරවත්භාවය මාතෘකාව ද ඇතුළු ව - ලකුණු 08**

| | |
|---|---|
| මාතෘකාව ද සහිත ව සාරවත් කරුණු ප්‍රමාණවත් ව ඉදිරිපත් කිරීම, මාතෘකාව රචනාවට ගැළපෙන බව, මනා භාෂා භාවිතය, තේමාවට අදාළ ව ලියා තිබීම, සරුබව හා සමබව නිවැරදි ව රැක තිබීම, වචන 250ට සමීප ව පැවතීම | 8-7 |
| සාරවත් කරුණු කිහිපයක් පමණක් ඉදිරිපත් කිරීම, මාතෘකාව ද රචනාවට ගැළපෙන පරිදි යොදා තිබීම, භාෂා ශෛලිය තරමක් හොඳින් පැවතීම, තේමාවට අදාළ බව තරමක් දුරස් වීම, සමබවෙහි හා සරුබවෙහි තරමක් දුර්වලතා පැවතීම, වචන ගණන 200ට වඩා අඩු වීම | 6-5 |
| සාරවත් කරුණු ප්‍රමාණවත් පරිදි නොතිබීම, භාෂා ශෛලියේ දුර්වලතා පැවතීම, තේමාවට අදාළ නොවීම, මාතෘකාවක් යොදා තිබීම, සරුබව හා සමබව නොපැවතීම, වචන ගණන 200ට අඩු වීම | ලකුණු 4ට අඩු |

**සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය - ලකුණු 12**

| | |
|---|---|
| උසස් ප්‍රකාශන ශක්තිය, මැනවින් කරුණු සංවිධානය කර තිබීම, ස්වීයත්වය ප්‍රදර්ශනය කිරීම, නිර්මාණාත්මක ව ලියා තිබීම, නිරවුල් බව, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය භාවිත කිරීම | 12-10 |
| ප්‍රකාශන ශක්තියෙහි දුර්වලතා තරමක් පැවතීම, කරුණු සංවිධානයේ දී දුර්වලතා තරමක් දක්නට ලැබීම | 9-7 |
| ප්‍රකාශන ශක්තියෙහි දුර්වලතා තරමක් පැවතීම, කරුණු සංවිධානය කර ගැනීමේ දී දුර්වලතා දක්නට ලැබීම, ස්වීයත්වයෙහි ගැටලු දක්නට ලැබීම, නිර්මාණාත්මක ව කරුණු ඉදිරිපත් කිරීමේ ගැටලු පැවතීම, භාෂා ව්‍යවහාරයෙහි දුර්වලතා පැවතීම | 6- 4 |
| ප්‍රකාශන ශක්තියෙහි බොහෝ දුර්වලතා තරමක් පැවතීම, කරුණු සංවිධානය කර ගැනීමේ දී බොහෝ දුර්වලතා දක්නට ලැබීම, ස්වීයත්වය ප්‍රදර්ශනය නොකිරීම නිර්මාණාත්මක භාවය දක්නට නොලැබීම, නිරවුල් නොමැති වීම, භාෂා ව්‍යවහාරයේ බොහෝ දුර්වලතා පැවතීම | 3-1 |

**ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි.**

| | |
|---|---|
| ව්‍යාකරණ රීති නිවැරදි ව අනුගමනය කර තිබීම, පැහැදිලි අත් අකුරු භාවිත කිරීම, විරාම ලක්ෂණ නිවැරදිව භාවිත කිරීම, නිවැරදි ඡේද වෙන් කිරීම, අක්ෂර වින්‍යාස රීති භාවිතය | 5 |
| ව්‍යාකරණ දෝෂ, අපැහැදිලි අත් අකුරු, විරාම ලක්ෂණමය දෝෂ, අක්ෂර දෝෂ තරමක් පැවතීම | 4-3 |
| ඉහත දෝෂ බහුල වීම | 1 |

03. සාරාංශකරණය

අන්තර්ගතය

- පැරණි ගෘහ නිර්මාණ කලාවේ පිළිබිඹුවක් වන ශිලා උද්‍යාන නිර්මාණය සඳහා යොමු වී ඇත්තේ අල්ප අවධානයකි.
- සීගිරි පව්ව හා එහි සිතුවම් නරඹන්නෝ සීගිරි උද්‍යාන ගැන සැලකිලිමත් නොවෙති.
- මෙම උද්‍යාන රෝම උයන් වතුවලට පමණක් දෙවැනි වන පැරණිතම අලංකාර උද්‍යානයෝ ය.
- සීගිරියේ ගිම්හාන මාලිගා දෙක දෙපස නොගැඹුරු කෘත්‍රිම දිය පහරවල් හිරිගලින් තැනූ දියමලින් චමත්කාර වී ඇත.
- කැණීම්වලින් සොයාගෙන ශුද්ධ කරන ලද මෙම දියමල් පීඩනයක් සහිතව වැඩි ජලයෙන් විසිතුරු ලෙස පණ ගැන්වෙයි.
- මෙමගින් සිංහලයන්ගේ විනෝදකාමී සොඳුරු ලොවක සිරිය මවා ලන සේ යොදා ගත් ජල තාක්ෂණයේ අපූර්වත්වය විදහා දැක්වෙයි.

ලකුණු විග්‍රහය :

1. අන්තර්ගතය - ලකුණු 06 යි
2. වචන ගණන - ලකුණු 02 යි
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 02 යි

**සාරාංශයේ අන්තර්ගතය සඳහා ලකුණු පිරිනැමීම - ලකුණු 06**

| | |
|---|---|
| ප්‍රධාන කරුණු ඉදිරිපත් කර තිබීම, වාක්‍ය අතර සම්බන්ධතාව ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීම, නිරවුල් ව කරුණු ඉදිරිපත් කර තිබීම, වචන ගණන අදාළ සීමාව තුළ පැවතීම. | ලකුණු 05 - 06 |
| ප්‍රධාන කරුණු කිහිපයක් පමණක් ඇතුළත් වීම, වාක්‍ය අතර සම්බන්ධතාව තරමක් රැක ගැනීම, වචන ගණන 55-65 අතර පැවතීම, නිරවුල් බව රැක ගැනීම. | ලකුණු 03 - 04 |
| ප්‍රධාන කරුණු ස්වල්පයක්වත් ඉදිරිපත් කර තිබීම ල වාක්‍ය අතර සම්බන්ධතාව ගිලිහී තිබීම, වචන ගණන 55ට අඩු වීම, නිරවුල් බව ගිලිහී තිබීම. | ලකුණු 01 - 02 |

04.

i.
- නීති පැනවීම
- යුද්ධය හා සාමය පිළිබඳ තීරණ ගැනීම
- රටේ ඉහළම අධිකරණය වශයෙන් රට වැසියන් ජීවිතය හා මරණය පිළිබඳ තීරණ ගැනීම.

(මෙයින් කරුණු දෙකක් සෑහේ)

ii. • චාරිත්‍ර වාරිත්‍ර හා සම්ප්‍රදායට ගරු කිරීම සිදු වීම
   • ආගමානුකූල සම්ප්‍රදායන් අනුගමනය කරන්නට සිදු වීම
   • අමාත්‍යවරුන්ගේ හා මහානායක හිමිවරුන්ගේ උපදෙස් පිළිගැනීමට සිදු වීම
   (මෙයින් කරුණු දෙකක් සෑහේ)

iii. රටේ සම්මත නීතිරීති නොසලකා කටයුතු කිරීම නිසා

iv. • ආරක්ෂක කටයුතු
   • යුද කටයුතු
   • පොදු කටයුතු
   • රජ වාසල සේවා කටයුතු
   • රජුගේ පෞද්ගලික සුඛ විහරණ කටයුතු
   (මෙයින් කරුණු දෙකක් ලිවීම සෑහේ)

v. අසාහය - ප්‍රබල/ අසමාන/ සමාන නොවූ
   සුඛ විහරණය - සැප සේ ගත කිරීම/ සුව සේ ජීවත් වීම

(ලකුණු 02 ×10 =20)

**05. රාජකාරී ලිපිය**

**ලකුණු** විග්‍රහය **මුළු ලකුණු - 15 යි**

1. ආකෘතිය - ලකුණු 04 යි
2. අන්තර්ගතය - ලකුණු 08 යි
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි

1. ආකෘතිය - ලකුණු 04යි

- යවන්නාගේ ලිපිනය - ලකුණු 04 යි
- ලබන්නාගේ නම හා ලිපිනය - ලකුණු 01 යි
- මාතෘකාව - ලකුණු 01 යි
- අත්සන හා දිනය - ලකුණු 01 යි

2. අන්තර්ගතය - ලකුණු 08 යි

1. මාර්ගය අබලන් ව තිබූ බව - ලකුණු 01 යි
2. මාර්ගය ප්‍රතිසංස්කරණය කළ බව - ලකුණු 01 යි
3. පෙර පැවති බස් රථය ධාවනය නොවන බව - ලකුණු 01 යි
4. බස් රථය ධාවනය වීමේ ප්‍රයෝජන - ලකුණු 02 යි
5. බස් රථය ධාවනය නොවීමේ දුෂ්කරතා - ලකුණු 02 යි
6. බස් රථය නැවත ලබා දෙන ලෙස ඉල්ලීම - ලකුණු 01 යි

3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි.

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්තාඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, විරාම ලක්ෂණ සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

**පුවත්පත් වාර්තාව**

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 15යි

1. ආකෘතිය - ලකුණු 04යි
2. අන්තර්ගතය - ලකුණු 08යි
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03යි

1. ආකෘතිය - ලකුණු 04 යි
   2. මාතෘකාව - ලකුණු 01 යි
   3. වාර්තාකරු - ලකුණු 01 යි
   4. යෝග්‍ය ලෙස සිද්ධි ගැළපීම - ලකුණු 02 යි

2. අන්තර්ගතය - ලකුණු 08යි (පහත කරුණු සඳහා ලකුණු 01 බැගින් පිරිනමන්න)

1. පැවැත් වූ දිනය
2. පැවැත් වූ වේලාව
3. මුඛ්‍ය අරමුණ
4. ප්‍රධාන අමුත්තා
5. ත්‍යාග හා සහතිකලාභීහු
6. උත්සව විශේෂාංග
7. සංවිධානය
8. අනුග්‍රහය

3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03 යි

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්තාඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, ඡේද වෙන් කිරීම

සිංහල භාෂාව හා සාහිත්‍යය

III පත්‍රය - පිළිතුරු

1.

(i) (අ) උග්ගසේන තෙරුන්

(ආ) සද්ධර්මරත්නාවලිය

(ii) (අ) ළය යට සසල බව මිත් මතු නොනැගෙද්දෙන්

(ආ) ඇ

(iii) (අ) මැටිල්ඩා

(ආ) ගී ද මෝපසාං

(iv) (අ) මූසිල

(ආ) රූපක/ රූපකාලංකාර

(v) (අ) සේනකාදි පණ්ඩිතවරු සතර දෙනා

(ආ) මියුලු නුවර වටලෑම

(vi) (අ) කල්පනා ලෝකය/ සාහිත්‍ය විද්‍යාව

(ආ) කව් සිළුමිණ

(vii) (අ) තුන් රුසට ම අයත් වූ ශිෂ්‍ය පිරිස

(ආ) පොළොන්නරු

(viii) (අ) පුංචිරාළ වෙදරාළ

(ආ) බබුන් ජීවත් සිටී ද නැති ද යන්න පිළිබඳ ආරංචිය

(ix) (අ) උලකුඩය දේවියට පුත් කුමරෙකු ලබා දෙන ලෙස ඉල්ලමින් කැලණියේ විභීෂණ දෙවියන්ට කරන ආයාචනය

(ආ) මහාකවි කාලිදාස

(x) (අ) පුනරුත්පත්තිය සහ තවත් කෙටිකතා

(ආ) ප්‍රබුද්ධ/ සිංහල ගද්‍ය පද්‍ය නිර්මාණයන්හි රිද්ම ලක්ෂණ

(ලකුණු 02×10=20 යි)

2. (i) (අ) සීතල ජලය/ සුදු නෙලුම්

(ආ) අනුප්‍රාසය - කුළින් කුළම/ දොළින් දොළම/ කල් යල් / තල් පොල්/ පළින් පළම/ තළින් තළම

එළිසමය - කඳුරු ය/ කුඹුරු ය/ මැඳුරු ය/පඬුරු ය

විරිත - මාත්‍රා 18 කින් සමන්විත/ සමුද්‍රඝෝෂ විරිත

(ii) (අ) සත්‍ය ක්‍රියා / ගැබ් මුළා වූ, කුසෙහි හරස් ව පිහිටි දරු ගැබක් සහිත

(ආ) අඟුල්මල් මහ තෙරුන් අසුන් ගෙන සත්‍ය ක්‍රියා කළ ස්ථානයේ වේදිකාවක් සැදූහ. කුසෙහි හරස් ව සිටින දරු ගැබක් සහිත තිරිසන් සතුන් පවා ගෙනවුත් එම වේදිකාවේ නිදි කරවති. එවිට ම නිරෝගී ව දරුවා මවු කුසින් බිහිවේ. යම්කිසි කෙනෙක් ශක්තිය පිරිහී වේදිකාව දක්වා ගෙන ඒමට නොහැකි වූ අවස්ථාවේ දී ඇයට වේදිකාව සෝදා එම ජලය රැගෙන ගොස් හිසෙහි ගැල්වූ විට ඒ මොහොතේ ම දරු ගර්භයේ බරින් මිදුණා ය. පැවතියා වූ වෙනත් රෝග තත්ත්වයන් ද සුවපත් වී.

(iii) (අ) එළි පෙහෙළි කිරීමෙන්/ ශුද්ධ කිරීමෙන්
ආගන්තුක සත්කාරය

(ආ) ගසක් කැපීමට පෙර ගසේ මුල් ප්‍රදේශය ශුද්ධ කර ගැනීම
සී සෑමක දී ගොවියා නඟන අඬහැරය අනුව එහි ස්වභාවය පෙන්නුම් කිරීම.

(iv) (අ) මහා බෝධිසත්ත්වයන්ගේ දිගන්තරයේ පතළා වූ තේජස්

(ආ) එඩිතරව/ නොබියව
වැජඹෙන/ විරාජමාන

(v) (අ) නිල් පැහැයෙන් යුතු දිය/ ජලය

(ආ) හුලංදා ඔය පිරී ඉතිරී ගලන හඬින්

(ලකුණු 04×5=20යි)

3. (අ) උම්මග්ග ජාතක කතාකරුවා විසින් මහෞෂධ චරිතය විස්තර කරන සෑම අවස්ථාවක ම එම චරිතයේ තේජාන්විත පෞරුෂය, ප්‍රඥාව, නිර්භීතකම ආදි උසස් ගුණ නිරූපණය වන ආකාරයකට එය සිදු කරනු ලබයි. කතුවරයා විසින් මෙන් ම මහෞෂධ පඬිවරයාගේ සිතිවිලි මාර්ගයෙන් ද, කථාවේ වෙනත් චරිත මාර්ගයෙන් ද මහෞෂධ පණ්ඩිතයන් පිළිබඳ පවසන අදහස් කෙරෙහි මෙහි දී අවධානය යොමු කොට තිබිය යුතු ය.

- "ඒ මහෞෂධ පණ්ඩිතයන් විසින් රක්නා ලද මිථිලා නම් රාජධානිය සිංහයකු විසින් රක්නා ලද රත් ගල් ගුහාවක් පරිද්දෙන් වෙන කිසි කෙනෙකුන් විසින් ගන්ට නොහැක්කී ය."
- ".... මේ රජ්ජුරුවනට මා මුත් අනෙක් පිළිසරණක් නැති. රජ්ජුරුවන් අස්වසාලමි'යි සිතා ඉක්බිති රජ්ජුරුවනට මහ බෝසතාණන් වහන්සේ සැට යොදුන් රශ්ගල් තලා මස්තකයෙහි නාද කරන ලද සිංහ රාජයකු මෙන්" නො බව මැනව, ...... මම කැටක් ගෙන කපුටු රැසක් පලවන එකක්හු මෙන් ද දුන්නක් අල්ලාගෙන වඳුරු මුළක් පලවන එකක්හු පරිද්දෙන් ........"

- "මහෞෂධ පණ්ඩිතයෝ නම් මම ය. කිසි භයක් නො කරව; මාගේ අනුභාව බලව"
- මහ බෝසතාණන් වහන්සේ ද ඔද වැඩියා වූ සාගරය පරිද්දෙන් පොළොව මැඩ පියන්නා සේ වීරිය පුරා ගෙන යන්නා වූ ඇත් අස් ...... කෙසරු සලා විදහා කිලිපොළන්නා වූ සිංහ රාජයකු සේ විජෘම්භනය කෙරෙමින් ........
- ජාතක කතාකරුවා බමුණු සමාජය බලවත් අවඥාවට ලක් කිරීම සඳහා ගන්නා උත්සාහය කේවට්ට චරිතය නිරූපණය කොට ඇති ආකාරයෙන් පැහැදිලි වෙයි. කේවට්ටගේ කපටි කෛරාටික ගති මෙන් ම නිවට, නියාලු, කැදර ගති ද උපයෝගි කර ගෙන උම්මග්ග ජාතක කතාකරුවා කේවට්ටගේ චරිතය අවඥාවට ලක් කරන අවස්ථා පහත දැක්වෙයි.
- ගිරා පෝතකයෝ ඒ මන්ත්‍රණය අසා නිමවා උන් දෙදෙනා මන්ත්‍රණය කොට අන්තයෙහි දි, සාල්ලෙක ලා ලා පාතට බාන කෙනෙකුන් මෙන් කේවට්ට බමුණා හිසැ වර්චස් පිඬක් හෙළා, කිමෙක්දැ' යි කට දල්වා ගෙන උඩ බැලූ තැනැත්තවුන්ගේ මුඛයේ නැවත වර්චස් පිඬක් හෙළා ....... "
- මේ කේවට්ට මහල්ලා ඇතුළු වූ අඥාන ජඩයෝ මා තව ම මහෞෂධ පණ්ඩිත බව නොදන්නා වන් හ'......"
- .. ඒ අසා "ආචාරීනි උපාය නම් ... කිම් ද? මේ සා මහත් වූ තොපගේ උපායෙකින් වැඩකුත් නිමාවකුත් දුටු දැ නැති"
- "....  මා නො වඳුව'යි කිය කියා මුඛය හා සමග නළල පෙරළ පෙරළා කොරසැඩි බිම උලා රත් වද මලක් සේ ලේ හා පස් හා වකා"
- "කොල පව්වූ දුෂ්ට අධර්මිෂ්ඨ වූ නිකෘෂ්ට අනාචාර ස්වරූප ඇති අවලක්ෂණ වූ අඥාන බමුණු මහල්ල ..... "

(ලකුණු 15යි )

නැතහොත්

(අ) * සැළලිහිණි සන්දේශ කතුවරයා අර්ථාලංකාර හා ශබ්දාලංකාර අපූර්ව වස්තු වර්ණනා කිරීමෙහි ලා ඉතා සාර්ථකව යොදා ගෙන ඇත.

අර්ථාලංකාර

- **මහ මුහුද දැක්වීමේ දී - උපමා රූපක යොදා ගැනීම**

උදා: වල දින අදහසින් මෙන් සුර ගඟ අඟන
නල බල සසල දළ රළ පෙළ නුබ නැඟෙන

- **සමනොළ කන්ද - රූපක**

උදා: කැරපුද වඳින රුදි මුනි සිරි පා තඹර

- **කයිකාවල - මුරපොළ**

උදා: අයි රාවණ වුවත් නවතන රිසින් එන
කයි කාවලෙහි දැකැ සෙබළුන් රැක සිටින
වයි යාකරන් මල් තුරු ගන වන හිසින

- **සපුමල් කුමරු ජයග්‍රහණය**

උදා: බල සේනානායක සපු කුමරු එන

ශබ්දාලංකාර

- **එළිසමය අනුප්‍රාසය - ගුරු බැවුල ගම ඇසුරෙන්**

  උදා: රිවි තැවුලේ පිපි කමලේ විල් ගැවසී

- **එළිසමය - සුමුටාන ගම ඇසුරෙන් තරුණයන්ගේ ස්වරූපය**

  උදා: කස්තුරි තිලක සැදි නළලත සුමටාන

- මාත්‍රා 18කින් යුතු සමුද්‍රඝෝෂ විරිත යොදා තිබීම

  (බොහෝ පද්‍ය උදාහරණ ලෙස යොදා ගත හැකි වේ.)

4. මුනි සිරිපා සිඹිමින්නේ පද්‍ය පන්තියෙන් ජාතිකාභිමානී හැඟීම් ජනනය කිරීමත් අනාගත ජීවිත සාර්ථක කර ගැනීමට අවශ්‍ය මග පෙන්වීමත් සිදු වේ.

**ජාතිකාභිමානි හැඟීම් ජනනය කිරීම**

උදා:
- ජාතිය රන් විමනක් වේ
- ජාතික රණ දෙරණ මතේ
- තමන් ලැබූ දිවි පෙවෙතේ
  කොටසක් රට සමය වෙතේ
- නිදහස මහ මුහුදක් වේ

**චරිත සංවර්ධනයට කෙරෙන මග පෙන්වීම**

උදා:
- ඉටු කොට කළ යුතු යුතුකම්
- කාටත් හිමි පොදු දේ නම්
- මිතුරු කමින් පෙරට එතොත්
- සිනිඳු මොලොක් බව මෙලෙහි
- කරදර දහසක් හමු වී
  ඉන්ටැකි නම් සිනා වෙවී

නැතහොත්

මෑත ඉතිහාසයේ පහළ වූ ශ්‍රේෂ්ඨ කවියෙකු ලෙස මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර හැඳින්විය හැකි වුව ද ඔහු විසින් ලියා පළ කළ කාව්‍ය සංග්‍රහ කිසිවක් නැත. ඔහුගේ කවිත්වය ඉස්මතුව පෙනෙන්නේ ඔහු තැනූ නාට්‍යවලිනි. ඒ අතර සිංහබාහු නාට්‍යය සුවිශේෂී වෙයි. එහි උපයුක්ත භාෂාව කාව්‍ය ගුණයෙන් මෙන් ම ගීතවත් බවින් ද අනූන ය. සිංහයාගේ හා සිංහබාහුගේ සිතුම් පැතුම් නිරූපණය කරන අවස්ථාවන්හි නාට්‍යකරුවා යොදා ගෙන ඇති භාෂාව ගීතවත් බවින් යුක්ත ය.

- සිංහබාහු, සුප්පාදේවි හා සිංහ සීවලී ගල් ලෙනෙන් නික්ම ගොස් ඇති අන්දම දකින සිංහයා තුළ උපන් දැඩි ශෝකය නාට්‍යකරුවා ගීතවත් බසකින් ඔහු මුවට නංවන අපූරුව පහත ගීතවලින් පෙනී යයි.
- **සිංහබාහු සම්බන්ධ හැඟීම්**

  ගල්ලෙන බිඳලා
  ලෙන් දොර හැර ලා
  සිංහබා සිංහබා සිංහබා
  මා සොඳුර මා සොඳුර මා සොඳුර
  සිංහ සීවලී මා ප්‍රිය දියණිය
- **දියණිය ගැන ඇති හැඟීම**

  සුරතල් දියණිය

  මොළ කැටි වදනින්

  මා සනසන්නිය

  අහර පිසින්නිය
- **බිරිඳ ගැන ඇති හැඟීම**

  හෙනයක් සේ පතිත වූ අහසින්

  හිස මතට දෙදරුම් දී

  බමවා ම ඉඳුරන් ඇදුරු කරමින්

  පහරිනා රුදුරු

සිංහබාහු යෞවනත්වයෙන් පරිපූර්ණ තරුණයෙකි. ඔහු දකින සිහිනය නව ලොවකි. ස්වාධීන ජීවිතයකි. එමෙන් ම ඔහුට පැවරී ඇති වගකීම් හා යුතුකම් ඉටුකිරීමට ඔහුට අවැසි ය. ඒ සඳහා ඇති බාධා බිඳ දමා ඉදිරියට යාමට ඔහු සැරසයි. ඔහුගේ ඒ සිතුම් පැතුම් ප්‍රකට කෙරන තැන්වල ඔහු මුවට නංවන වදන් ගීතවත් බවින් පිරී ඇත.

කිම් ද මැණියනි ඔබ මේ
පවසන වදනා
ඇස් කන් ඇදහිය නොහේ ය
ඇසෙන මේ අරුමා

සිංහබාහු තුළ ලියලා එන අසහනය කොතෙක් දැයි පහත සඳහන් ගීයේ "කුමක් දෝ මේ පාපේ ලෙනේ මේ විසීමේ සෙතක් දෝ" යන කොටස පුනරුච්චාරණයෙන් ධ්වනිත කෙරෙයි.

- සිංහයෙක් වේ මා පියා
  ජන්මයෙන් ලත් මේ අරන්නේ
  පුරුදු වූ වාසෙ සදා ....
- ආත්මාභිමානයෙන් ඔද වැඩී ගිය යෞවන මදයෙන් මත් වූ තරුණයෙකුගේ ප්‍රකාශයක් සේ ඉදිරිපත් වන පහත ගායනයේ චිරන්තන සිංහල සාහිත්‍යයේ යෙදුම් ගීතවත්ව ගළපා ඇති අයුරු විමසන්න

  තුමුල ගතින් දා
  බාහු බෙලෙන් දා
  වෙමි සේ තිදසින් දා
  කුරිරු ගිජින්දා
  කුඹු තල සින්දා
  ලම් සේ කෙසරින් දා ...

5. කුරහන් වගාවේ ආරම්භයේ සිට අස්වනු නෙළා ගැනීම දක්වා වූ සමස්ත ක්‍රියාවලිය ම කුරහන් ඉසිමුව කළුවර බලලා කවි පෙළෙහි අන්තර්ගත වේ.

උදා:
- ආරම්භය - දුරුතු මහේ දි කැලයට වැදීලා
  මසක් පමණ කල් කැලෑවල් කොටාලා
- බිම් සකස් කිරීම - මැදින් දිනේ දී වල් ගිනි තබාලා
- වගාවේ මුල් අවස්ථාව - නිල්ල අඹති සත් දවසින් බැලුවා ම
- කිරි වැදෙන අවස්ථාව - ගොබ කළු වෙමින් කුරහන් කිරි වැද වැඩෙති
- වගාව ආරක්ෂා කිරීම - ඇහැට වෙහෙස ඇත තුන්යමට නිදි නැති
  හේනේ පැලේ මා විදිනා සුරුක්කන්
  වැට අහුරා ඌරන්ගෙන් වළක්කන්
- පලදාව සරු වීම - මෙදා හේනෙ පැහිලා ඇති කුරක්කන්
  රන්වන් කරල් බරවී ඇති සුරක්කන්
- අස්වැන්න නෙළා ගැනීම - කපමු නැනෙ ඉපනැල්ලේ සුබාවේ

6. මහගම සේකරගේ ප්‍රබුද්ධ කාව්‍ය සංග්‍රහයෙන් උපුටා ගෙන ඇති දෑතේ කරගැට සිඹ සනසන්නට පැදි පෙළින් ශ්‍රමය වගුරන ගොවි කම්කරු පිරිස් කෙරෙහි සහෘදයා තුළ ගෞරවයක් ජනිත කිරීමට කවියා උත්සාහ ගනියි. ගොවි බිමේ, වැඩ බිමේ කය වෙහෙසා වැඩකරන ශ්‍රමිකයාගේ මෙහෙවර දැයක් ගොඩනගන්නට ඉවහල් වෙයි. ඒ ශ්‍රමයට ගෞරවයෙන් කෘතවේදිත්වය පළ කළ යුතු ය. කවියා එම අදහස් ඉස්මතු කරන පහත සඳහන් අවස්ථා නිදසුන් ලෙස ඉදිරිපත් වී තිබිය යුතු ය.

ගොවියකුගේ ශ්‍රමය සතුටක් බවට පෙරළෙන්නේ භෝග සරුසාරව වැඩෙන සැටි දකින විට ය.

දෑතේ කරගැට සිඹ සනසන්නට
ළා ගොයමේ දළු පවන් සලයි
දහදිය මුතු ඇට මල් වරුසා වී
කරල බරින් පීදී වැගිරෙයි

රට ස්වයංපෝෂණය කළ මහ වැව් සෑදුණේ ද යෝධ මිනිස් ශ්‍රමයේ මහිමයෙනි.

දහසක් වැව් බැඳි යෝධ මිනිස් කැල
යළි ඉපදී ඇති මවු දෙරණේ...

ශ්‍රමිකයාගේ වෙහෙසෙහි ප්‍රතිඵල හිමි වන්නේ අනාගත පරපුරට ය. එබැවින් ශ්‍රමය වගුරන්නා කෙරෙහි අප හදෙහි ගෞරවයක් ඇති විය යුතු ය. ශ්‍රමය වැගිරීම යනු උසස් ක්‍රියාවකි.

මා ගත වෙහෙසට ආදරයෙන් දිය
උල්පත පාදන පුංචි පුතුන්
ඒ ගත වෙහෙස ම සතුටක් වෙයි මට
ඔබ සිහි වන විට පුංචි පුතුන්

7. දියමන්ති මාලය කෙටිකතාවේ එන මැටිල්ඩාගේ ස්වාමි පුරුෂයා ලෙසින් ලොයිසල් මහතා යහපත් ස්වාමි පුරුෂයකු ලෙස තම වගකීම් හා යුතුකම් මහත් වූ සෙනෙහසකින් හා ඕනෑකමකින් ඉටු කරන තරුණ ස්වාමියෙකි. වෘත්තියෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ සුළු ලිපිකරුවෙකි.

බිරිඳගේ විවිධ ක්‍රියාකාරකම් හමුවේ ඉවසිලිවන්තව කටයුතු කරයි. බිරිඳ සතුටු කරයි.

- නිවෙසේ වැඩපළ කර දීමට මෙහෙකාර දැරියක් යෙදවීම තුළින්
- සුප් බඳුනෙහි වැහුම් අරිමින් ප්‍රබෝධයෙන් කරන ප්‍රකාශය පිළිබඳ තැකීමක් නොකරන බිරිඳ පිළිබඳ ව කෝප නොගැනීම
- බිරිඳ සතුටු කිරීමට ප්‍රිය සම්භාෂණය සඳහා රැගෙන ආ ආරාධනා පත්‍රය අවඥාවෙන් මේසය මතට විසි කර දමද්දී එම අවස්ථාවේ වටිනාකම පහදා දීම
- තමාගේ සතුට වෙනුවෙන් අමාරුවෙන් ඉතිරි කළ මුදල් බිරිඳගේ අවශ්‍යතා සඳහා වියදම් කිරීමට ඉදිරිපත් වීම.
- මැටිල්ඩා ආභරණ නොමැති වීම පිළිබඳ චෝදනා මුඛයෙන් කතා කරද්දී ඔහුට හැකි පමණින් යෝජනා ඉදිරිපත් කිරීම
- උත්සව අවස්ථාවේ දී තම බිරිඳට සතුටින් කාලය ගත කිරීමට ඉඩ හැර දිගු වේලාවක් හිස් පාළු කාමරයක ගත කිරීම
- මාලය නැති වීම පිළිබඳ ව චෝදනා නොකර ඉතා වෙහෙස මහන්සි වී මුදල් සොයා ගන්නේ තම අනාගතය ම අවිනිශ්චිත බවට පත් කරමින් වීම.
- තම සියලු අවශ්‍යතා කැප කරන නමුත් ඒ පිළිබඳව චෝදනා හෝ අඬදබර නොව සහයෝගය, ආදරය, කැප කිරීම වැනි ගුණාංග ඉස්මතු වන ලෙස නිරූපණය කෙරේ. (අදාළ උද්ධෘත යොදා ගනිමින් මෙම අදහස් සනාථ කර තිබීම අවශ්‍ය වේ.)